**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2017**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම, කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

---------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථයක් විකිණීමෙන් ලද රු.3,660,000 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂන කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාළ වත්කම අයත් දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල පමණක් 2008 වර්ෂයේදී රු.මිලියන1,378 කට ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන අගය මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.240,036,680 ක් වූ වත්කම් වර්ග 10 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) අධිකාරිය සතු ඉඩම් හා තානායම් වෙනත් පාර්ශවයන්ට බදු දී තිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඒ සම්බන්ධව හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් දේපලවල සිදු කරන ලද රු.110,449,509 ක් වූ සංවර්ධන පිරිවැයට අදාල රු.87,063,977 ක සමුච්චිත ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් වටිනාකම හා සමුච්චිත ලාභය රු.87,063,977 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී 2016 හා පෙර වර්ෂ වෙනුවෙන් එකතුව රු.51,019,696 ක් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවා තිබූ අතර 2016 වර්ෂය වෙනුවෙන් ගෙවූ

දායක මුදල් සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හා පෙර වර්ෂ වෙනුවෙන් වූ ශේෂයන් සම්බන්ධයෙන් ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කිරීම වෙනුවට මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ආයෝජන (සංචාරක මණ්ඩලය) | 52,154,738 | ආයෝජන සහතිකය හෝ වෙනත් ලිඛිත සාක්ෂි සනාථ කිරීමේ ලිපි |
| (ආ) ආයෝජන (සංචාරක ප්‍රවර්ධන) | 976,509 | |
| (ඇ) සංචාරක අරමුදල | 930,000 | කොටස් සහතික හෝ වෙනත් ලිඛිත සාක්ෂි හා ශේෂය තහවුරු කිරීමේ ලිපි |
| (ඈ) නිධන් අරමුදල් ආයෝජන | 759,021 | |
| (ඉ) ශ්‍රී ලංකා සීමිත හෝටල් සංචාරක සමාගම | 750,000 | |
| (ඊ) වෙළඳ ණයගැතියෝ | 60,834,836 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (උ) විවිධ ණයගැතියෝ | 4,688,558 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඌ) ජල පරිභෝජන ණයගැතියෝ (පාසිකුඩා) | 23,227,328 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (එ) පල්දෝරු සේවා සැපයුම් සඳහා ලැබිය යුතු ගාස්තු | 124,752,772 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| (ඒ) ණයගැතියෝ - ජාතික කඩදාසි සංස්ථාව | 9,627,113 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| (ඔ) සැපයුම්කරුවන්ට හා සේවකයන්ටඅත්තිකාරම් | 21,302,883 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| (ඕ) දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම් | 67,624,406 | කේවල ශේෂ පදනම් කර ගත් විස්තරාත්මක උපලේඛන |
| (ක) ඉඩම් | 33,904,345 | අයිතිය සනාථ කරන ලද ලියවිලි |
| (ග) තැන්පතු / වෙනත් ගෙවීම් | 21,302,882 | තැන්පතුව තහවුරු කිරීමට අදාල ලියවිලි |

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු විවිධ ණය ගැති ශේෂ ලෙස රු.18,613,438 ක් දක්වා තිබුණු අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් වල එම ශේෂය රු.25,812,532 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.7,199,094 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.2,758,157 වර්ෂ 04 කට වැඩි කාලයක්ද රු.59,936,047 ක් වසර 1 ත් 4 ත් අතර කාලයක්ද අය නොවී පැවතුණි.

(ආ) ලැබිය යුතු තැන්පත් වටිනාකම රු.6,963,732 ක් වර්ෂ 5 ට වැඩි කාලයක්ද වර්ෂ 5 ත් 3 ත් අතර කාලයක් තුළ රු.1,700,000 ක්ද අය නොවී පැවතුණි.

(ඇ) පාසිකුඩා ජල පරිභෝජන ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.18,670,721 ක ශේෂයක් වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර කාලයක් තුළ අය නොවී පැවතුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව රඳවා ගැනීමේ මුදලින් වර්ෂ 04 ට වැඩි රු. 15,566,948 ක්ද වර්ෂ 02 ට වැඩි වර්ෂ 4 ට අඩු රු. 4,881,330 ක්ද, වර්ෂ 01 ට අඩු රු. 11,026,841 ක්ද නිරවුල් නොකර පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ IVපරිච්ඡේදයේ 26(1) උප වගන්තිය | ප්‍රකාශිත සහ සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ සහ වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) මුදල් රෙගුලාසි169(2) | චෙක්පත් උපලබ්ධිවීමට පෙර සේවා සපයා තිබීම හේතුවෙන් රු.650,034 ක් වටිනා චෙක්පත් 22කට අදාළ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (II)මුදල් රෙගුලාසි 396 | 2010 වර්ෂයෙ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසය තුල නිකුත් කරන ලද එහෙත් උපලබ්ධි නොවූ රු.2,895,858 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (III)මුදල් රෙගුලාසි 757 | වටිනාකම රු.1,880,781ක්වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.1 හා 9.14.2 වගන්ති | මානව සම්පත් කළමනාකරණයට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අත්පොතක් පිළියෙළ කර භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.385,538,658 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.373,897,908 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,640,750 ක වර්ධනයක් විය. වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ රු.91,611,471 කින් වැඩි වුවද සංචාරක සංවර්ධන බදු ආදායම රු.37,124,844 කින් හා බලපත්‍ර ගාස්තු රු.63,503,290 සහ වෙනත් ආදායම් රු.16,259,224 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ හා 2014 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් සිදුවී තිබුණි. එහෙත් 2014 වර්ෂයට සාපේක්ෂව2015 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදුවී තිබුණු අතර නැවතත් 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එය වර්ධනය වී තිබුණි. කෙසේ වුවද,මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.381,486,482 ක් වූ අධිකාරියේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.623,332,169 ක් වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

අධිකාරිය විසින් බාහිර පුද්ගයන්ට එරෙහිව අධිකරණයේ නඩු 03 ක් ගොනු කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර, එම පරිච්ඡේදයේ (3) උපවගන්තිය අනුව අදාල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් / ප්‍රතිඵල (Output/Outcome) ඇතුළත් විය යුතුය. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉහත පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 04 (ඇ) ඡේදය අනුව ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කර ගත යුතු වුවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ එක් එක් අංශයේ වියදම් සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රු.මිලියන 1,979.8 ක් වූ අතර සත්‍ය වියදම රු.මිලියන 571.32 ක් විය. මේ අනුව වියදම් ඇස්තමේන්තු කිරීමේදී අධි ඇස්තමේන්තු ගත කර ඇති බව නිරීක්ෂණය විය.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 111 අතුරින් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 37 කි. එනම් සියයට 33.33 කි. වර්ෂය තුළ ආරම්භ කළ ක්‍රියාකාරකම් අතුරින් සියයට 50 කට අඩුවෙන් මුදල් වැය කළ ක්‍රියාකාරකම් 22 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට මුදල් වැය නොවූ ක්‍රියාකාරකම් 66 ක් වූ අතර, ඒ සඳහා රු.මිලියන 681.83 ක් වෙන් කර තිබුණි.

(ආ) අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ සංචාරක නිවාඩු නිකේතන 04 ක් සහ සංචාරක නිකේතන 03 ක් පැවතුණි. අධික පොදු කාර්ය වියදම හේතුකොටගෙන නිවාඩු නිකේතන 05ක් රු. 28,348,616 ක ඌනතාවක් ජනිත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සියලුම නිකේතනවල ශුද්ධ පාඩුව රු. 3,391,757 ක් වී තිබුණි. නිකේතන 05 ක පහසුකම් සැලැසීම හා සේවා කිරීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් සියයට 21 ක් පමණක් වැයකර තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-----------------------------------**

සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ඉඩම් බදු දීම අධිකාරිය මගින් සිදුකරනු ලබන අතර ත්‍රිකුණාමලය, යාල පලටුපාන හා කල්කුඩා සංචාරක ප්‍රදේශ වලට අයත් ඉඩම් බදු දීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බදු දී තිබුණේ ඉඩම් අක්කර 30ක් පමණි.

(ආ) සංචාරක සංවර්ධන කටයුතු සඳහා යාල පලටුපාන ප්‍රදේශයෙන් අධිකාරියට පවරාගෙන ඇති අක්කර 1110 ක භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයෝජකයන් වෙත බදු පදනම මත ලබා දී තිබුණේ අක්කර 63 ක් පමණි.

(ඇ) කල්කුඩා (පාසිකුඩා ) සංචාරක ප්‍රදේශයට අයත් අක්කර 202 කින් සමාලෝචිත වර්ෂ අවසානයට බදු දී තිබුණේ අක්කර 103 ක් වූ අතර කල්පිටිය හා අවට දූපත් වලින් පවරා දී තිබූ අක්කර 3986 කින් බදු දී තිබුනේ අක්කර 177 ක් පමණි.

**4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 වර්ෂයේදී සංචාරක කර්මාන්තය සඳහා ලංකා සංචාරක මණ්ඩලයටද, පසුව සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලද බෙන්තොට සංචාරක නිවාඩු නිකේතනයට අයත් අක්කර 94 ක පමණ භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම උපයෝජනය කර තිබුණේ අක්කර 54 ක පමණ භූමි ප්‍රමාණයකි. මේ අනුව වර්ෂ 46 කට වැඩි කාලයක් අක්කර 40 කට වැඩි භූමි ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි වර්ග අඩි 2880 ක පමණ ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයක් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආර්ථිකමය කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) අධිකාරියට පවරා දී ඇති එහෙත් අධිකාරිය බදු ආදායම් නොලබන අක්කර 69 ක වපසරියක් සහිත ඉඩම් හා ගොඩනැගිලි 10ක් පැවතුණි.

(ඈ) බිබිල සහ රාගල ප්‍රදේශවල නිවාඩු නිකේතන 2 ක් පැවැති නමුත් මෙම නිකේතන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු නාම15 ක් යටතේ තනතුරු 226 ක් ලෙස අධිකාරියේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව 195 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 31 වී තිබුණි.

## 5 තිරසාර සංවර්ධනය

---

### 5. 1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

---

තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2017 මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 22 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණනය සැලැස්මට අනුව විෂයයන් 13 ක විගණන කටයුතු සැලසුම් කර තිබූ නමුත් ඉන් විෂයයන් 07 ක් විගණනය සිදු කර නොතිබුණි.

### 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-------------------------------------------

### 6.3.1 ප්‍රසම්පාදනයන්

---------------

2014 ජුනි සිට මධ්‍යම වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට සැලැසුම් සකස් කරමින් තිබූ අතර 2018 සැප්තැම්බර් 30 දින දක්වා එම කාර්යය වෙනුවෙන් ආසන්න වශයෙන් රු.14,029,949 ක මුදලක් වැයකර තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.5 ඡේදයට අදාල අතිරේක 9 ප්‍රකාරව ඉදිකිරීම් ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 60 ක් ඉක්මවූ මෙම වායුසමීකරණ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ EM I ශ්‍රේණියේ ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු කැඳවිය යුතු නමුත් 2017 ජුනි 07 දින පල කළ පුවත්පත් දැන්වීමට අනුව මෙය EM 2 හෝ ඊට වැඩි සුදුසුකම් ඇති සැපයුම්කරුවන්ට/ අයදුම්කරුවන්ට අයදුම් කල හැකි බව දන්වා තිබුණි.

(ආ) 2017 නොවැම්බර් 27 දිනැති වැඩ ප්‍රදානය කිරීමේ ලිපිය අනුව එහි සඳහන් දින සිට දින 180 ක් ඇතුළත අදාළ කාර්යය නිමකල යුතු වුවද 2018 අගෝස්තු වන විට දින 283 ක පමණ කාලයක් ගත වී තිබුණද මූලික වැඩ කටයුතුවත් අවසන් කර නොතිබුණි.

### 6.3.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

2016 පෙබරවාරි 10 දින ආරම්භ කර 2016 ජුනි 08 දින නිම කළ යුතුවූ පාසිකුඩා ජලසම්පාදන ව්‍යාපෘතියේ, බිම් ජලාශය, පොම්පාගාරය ආරක්ෂිත කුටිය ඉදිකිරීම හා වැඩබිම් වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්තුව රු.22,258,780 ක්‍රොන්ත්‍රාත් වටිනාකමට පෞද්ගලික ආයතනයට 2016 මාර්තු 02 දින පවරා තිබුණි. විගණිත දිනය වන විටත් මෙම කොන්ත්‍රාත්තුවට අදාල අවසන් බිල් පත ඉදිරිපත් කර නොමැති අතර කාර්යය නිමකළ බවට නිර්දේශයන් ලබා දී නොතිබුණි. දින 119 කින් නිමකළ යුතු මෙම කොන්ත්‍රාත්තුව මේ වන විට වසර 2 කට වඩා ප්‍රමාද වී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන ඇපකරයද කල් ඉකුත් වී තිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

----------------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 405 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018 සැප්තැම්බර් 10 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.6 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්පිටිය තොරයිඅඩි ජැටිය ඉදිකිරීම සහ වන්නිමුන්දලම කලපුව අසල තාර දැමීම සඳහා කළුගල්,බොරළු හා ඒ.බී.සී.සැපයීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙළෙඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ii) කල්පිටිය වැඩබිමට කළුගල්,බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බවට සඳහන් ටිපර් රථයක ධාරිතාවය කියුබ් 3 ක් වුවද කියුබ් 4 බැගින් ද්‍රව්‍ය සැපයූ ලෙස සලකා ගෙවීම් කිරීම නිසා වැඩිපුර ගෙවූ රු.2,549,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කළුගල් කියුබ් 1648 ක්, ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් ලෙස භෞතිකව භාර නොගත් ද්‍රව්‍ය වටිනාකම වූ රු.10,196,000 ක් සඳහා අධිකාරිය විසින් ගෙවීම්කර තිබුණි.

(ආ) කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ සිදුකළ අළුත්වැඩියා කටයුතුවලට වැඩිපුර ගෙවන ලද රු.11,089,228 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඇ) කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඩෝසර් යන්ත්‍ර සැපයූ බවට සැපයුම්කරුවන් ඉදිරිපත් කළ ලිපි තුනක් පදනම් කරගෙන පැය 941.7 ක් සඳහා රු.3,226,950 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෙම ඩෝසර් යන්ත්‍ර සේවය ලබාගත් බවට දිනපතා මනු කියවා වැඩ පැය සටහන්කර එම වැඩ පැය වාර්තා අධිකාරියේ නිලධාරියෙකුගෙන් සහතික කරගැනීමකින් තොරව මෙම ගෙවීම සිදුකර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති වැඩ පරීක්ෂක විසින් ට්‍රැක්ටර් සේවාව සතුටුදායක ලෙස ලබා ගත් බවට උක්ත ලිපි තුනේ සහතික කර තිබුණි.

(ඈ) අධිකාරිය විසින් අවශ්‍යතාවය ඇගයීමකින් තොරව සෝපා පුටු 55 ක් මිලදී ගැනීමට රු.2,659,875 ක් වැයකර තිබුණි. මෙම පුටු මිලදී ගැනීමට සීමිත මිල ගණන් කැඳවා තිබුණද ආදර්ශ පුටුව සැපයූ ආයතනයෙන් මිල ගණන් ලබා ගෙන නොතිබුණි. පුටු මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය පටහැනිව අත්තිකාරම් ලෙස මුළු සැපයුම් වටිනාකමින් සියයට 50 ක් ගෙවා තිබුණ අතර අවස්ථා කීපයකදී පුටු ප්‍රවාහනය වෙනුවෙන් රු.211,000ක නිශ්කාර්ය වැයක්ද දරා තිබුණි.එසේම රු.159,803 ක් වටිනා පුටු 03 ක් අස්ථානගත වී තිබුණි.

(ඉ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ඉක්මවූ ව්‍යාපෘතියක් වශයෙන් වර්ගකර වැටුප් හා දීමනා ගෙවා තිබීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිළධාරීන් වෙත වැඩිපුරගෙවා තිබූ රු.3,780,253 ක මුදල අධිකාරියට අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඊ) පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේ දී අදාළ භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන ඉදිකිරීම් සිදු නොකිරීම හේතු කොටගෙන කාණු පද්ධතියේ ජලය රැඳීතිබෙන බව විගණනයට නිරීක්ෂණය වූ අතර විගණනයේදී ගණනය කළ තත්‍ය මිණුම් වාර්තා,බිල්පත්වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් සමග සැසඳීමේදී රු.3,792,420 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(උ) අධිකාරියේ "වන් ස්ටොප්" ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඌ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 8 ඡේදයේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා වන නිර්දේශවලට පටහැනිව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බෙන්තොට පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ශ්‍රම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව පුද්ගලික ආයතනයක් වෙත පවරා දී තිබුණි.

(එ) පාසිකුඩා සංචාරක කලාපයේ ජාතික නිවාඩු නිකේතනයේ කිලෝමීටර් 1.126 ක පිවිසුම් මාර්ගය කාපට් කිරීමේ පිරිවැය ඇස්තමේන්තුව ව්‍යාජ ලෙස අදියර 04 කට කොටස් කර ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබූ අතර ඉදිකිරීම් සඳහා රු.22,013,564 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මෙහෙයුම් පාලනය | (i) සංවර්ධන වැඩසටහන් අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිදු නොකිරීම<br>(ii) භෞතික ප්‍රගතිය පිළිබඳ ව වාර්තා කිරීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම.<br>(iii) ප්‍රසම්පාදන කාර්යය පැහැර හැරි සැපයුම්කරුවන් වෙනුවෙන් අසාදු ලේඛණයක් පවත්වා නොගැනීම.<br>(iv) ප්‍රසම්පාදනයන් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී තාර්කික ප්‍රවේශයන් අනුගමනය නොකිරීම.<br>(v) සැපයුම්කරුවන්ගෙන් විධිමත් පරිදි වගකීම් සහතික ලබා නොගැනීම. |
| (ආ) ව්‍යාපෘති පාලනය | (i) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවා අධීක්ෂණය හා ගෙවීම් නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී කළ වැඩ වාර්තා පරීක්ෂාවකින් තොරව ගෙවීම් සිදුකර තිබීම.<br>(ii) කොන්ත්‍රාත්තු ලේඛණයක් පවත්වා නොගැනීම. |
| (ඇ) වත්කම් කළමනාකරණය | (i) වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම.<br>(ii) වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පාලනය | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) ගිණුම්කරණය | (i) ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීමේදී දුර්වලතා පැවතීම.<br>(ii) ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් නොකිරීම.<br>(iii) ප්‍රාග්ධන වත්කම් ගිණුම් තැබීමට අදාළ මූලික ලියකියවිලි නොමැතිව ගිණුම් තැබීම් සිදුකර |

තිබීම.